# දැන්වීමයි

## විෂය සංගම් හා අනෙකුත් සංගම් ලියාපදිංචි කිරීම

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය හා පීඨ ශිෂ්‍ය සමිති හැර සිසුන් විසින් පිහිටුවා ගනු ලබන වෙනත් සියලු ම සංගම් 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කළ යුතුය.

මෙම වෙනත් ශිෂ්‍ය සංගම් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ අදාළ විස්තර ශිෂ්‍යසේවා අංශයෙන් ලබා ගත හැකි අතර, පසුගිය වර්ෂවල ක්‍රියාකාරී වූ සංගමයක ලියාපදිංචිය අලුත් කිරීමත්, නව සංගමයක් ලියාපදිංචි කිරීමත් සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට කටයුතු කළ යුතු වේ.

1. 2020/2021 අධ්‍යයන වර්ෂයට නව නිලධාරීන් පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන සංගමයේ ප්‍රථම රැස්වීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය තුළ දැන්වීම් මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දිය යුතුය.

2. කණිෂ්ඨ භාණ්ඩාගාරික අනිවාර්යයෙන්ම දෙවෙනි වසරේ විද්‍යාර්ථියෙකු විය යුතුය.

3. ලියාපදිංචිය සඳහා පහත සඳහන් ලිපිලේඛන මා වෙත ඉදිරිපත් කළ යුතුය.

   **A. සම්පූර්ණ නම් සහ ශිෂ්‍ය අංක ඇතුළත් නිලධාරි මණ්ඩලයේ නාමලේඛනය**
   **B. සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීම් වාර්තාව**
   **C. ප්‍රථම දැන්වීමේ පිටපතක්**
   **D. ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුරට පත් වන ආචාර්යවරයාගේ හෝ ආචාර්යවරියගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය**
   **E. සාමාජික නාමලේඛනයක්**
   **F. ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික විසින් අනුමත කරන ලද පසුගිය වර්ෂයේ අයවැය ලේඛනය හා ශේෂ පත්‍රය**
   **G. සංගමයේ ව්‍යවස්ථාව (අලුතින් ආරම්භ කරන ශිෂ්‍ය සංගම් සඳහා පමණි)**
   **H. යාවත්කාලීන කරන ලද බැංකු පාස්පොතෙහි පිටපතක්**

පසුගිය අධ්‍යයන වර්ෂවල පැවැති කිසියම් සංගමයක් නැවත ලියාපදිංචි කිරීමට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු සියලු වාර්තා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මඟින් මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් නැවත ලියාපදිංචිය සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

වැ.බ. නියෝජ්‍ය ලේඛකාධිකාරි/ශිෂ්‍යසේවා

කැලණිය විශ්වවිද්‍යාලය,

කැලණිය.

2022.09.01

2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ..........................................................................................
**ශිෂ්‍ය සංගමයේ නිලධාරි මණ්ඩලය**

1. සභාපති
2. උප සභාපති
3. ලේකම්
4. උප ලේකම්
5. ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික **(ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික අනිවාර්යයෙන්ම විශ්වවිද්‍යාලයේ ස්ථිර ආචාර්යවරයකු විය යුතුය)**
6. කණිෂ්ඨ භාණ්ඩාගාරික **(කණිෂ්ඨ භාණ්ඩාගාරික අනිවාර්යයෙන්ම දෙවැනි වසර ශිෂ්‍යයෙකු විය යුතුය)**
7. සඟරා සංස්කාරකවරු දෙදෙනෙක්
8. කාරක සභිකයන් සිව් දෙනෙකු (ඉහත සඳහන් නිලධාරි මණ්ඩලය හා කාරක සභිකයන් සිව් දෙනෙකුගෙන් විධායක කමිටුව සමන්විත වේ)

| **ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ නම** | **තත්ත්වය / තනතුර** | අධ්‍යයනාංශය | දුරකථන අංකය |
|---|---|---|---|
| | | | |

| **තනතුර** | **නම** | දුරකථන අංකය | වසර | ශිෂ්‍ය අංකය | අත්සන |
|---|---|---|---|---|---|
| **සභාපති** | | | | | |
| **උප සභාපති** | | | | | |
| **ලේකම්** | | | | | |
| **උප ලේකම්** | | | | | |
| **කණිෂ්ඨ භාණ්ඩාගාරික** | | | | | |
| **සඟරා සංස්කාරකවරු දෙදෙනා** | | | | | |
| | | | | | |

**කාරක සභිකයන් සිව්දෙනා**

| **නම** | වසර | ශිෂ්‍ය අංකය | අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**සභාපති / ලේකම්**